# සාම්ප්‍රදායික මැටි බඳුන් නිෂ්පාදන ක්‍රියාවලියේ විකාශනය පිළිබඳ අධ්‍යයනයක්

(ලූල්නෑව ගම්මානය ඇසුරින්)

එච්.එම්.එස්.එන්. බටගල්ල[1], එස්.අයි.එල්. සෙනෙවිරත්න[2], පි.ආර්.සී.පි.කේ. ආරියවංශ[3]

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
[1]shehaninipu@gmail.com , [2]ishanlakmal22@gmail.com, [3]charukapriyadarshani@gmail.com

ප්‍රමුඛ පදඃමැටි, ලූල්නෑව, සාම්ප්‍රදායික, කර්මාන්තය, තාක්ෂණය

## හැඳින්වීම

පුරාවිද්‍යාත්මක වශයෙන් මෙරට ඓතිහාසික පසුබිම අධ්‍යනය කිරීමේදී හමුවන ද්‍රව්‍යාත්මක සාධක අතර බහුලව දක්නට ඇති අවශේෂ ද්‍රව්‍යයක් ලෙස මැටි ආශ්‍රයෙන් සිදුකර ඇති විවිධ නිෂ්පාදන හඳුනාගත හැකි ය. ශ්‍රී ලංකාවේ කුඹල් කර්මාන්තය අනාදිමත් කාලයක සිට අද දක්වාම නොනැසී පවතින කර්මාන්තයකි. ලක්දිව මැටි කර්මාන්තයේ ඉතිහාසය පූර්ව ඓතිහාසික යකඩ යුගය දක්වා දිවෙන බව පිළිගත් මතයයි. මැටි භාණ්ඩ නිෂ්පාදනය අද වනවිට තාක්ෂණය සමඟ මුසු වී ඇත. ඒ අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් ලූල්නෑව ගම්මානයේ සාම්ප්‍රදායික මැටි මෙවලම් කර්මාන්තය පාරම්පරිකව සිදුවෙමින් පැවතෙන්නකි. වර්තමානය වන විට තාක්ෂණය සමඟ මුසු වී ඇති මෙම කර්මාන්තයේ විකාශනය පිළිබඳ ව අධ්‍යයනය කිරිම මෙමඟින් බලාපොරොත්තු වේ.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා දත්ත හා තොරතුරු එක්රැස් කිරිමේ දි ක්ෂේත්‍ර ගවේෂණය හා ක්ෂේත්‍ර නොවන ගවේෂණය භාවිතයට ගන්නා ලදි. ක්ෂේත්‍ර ගවේෂණය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කහටගස්දිගිලිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් ලූල්නෑව ගම්මානයේ කුඹල් කර්මාන්තයේ නියුතු පවුල් අධ්‍යයනය කරමින් හා අවශ්‍ය ඡායාරූප ලබාගැනිම සිදු කරන ලදි. ක්ෂේත්‍ර නොවන ගවේෂණයේ දි පුස්තකාල පරිශිලනය තුළින් මූලාශ්‍ර අධ්‍යයනය සිදු කරන ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

සාම්ප්‍රදායික මැටි භාණ්ඩ නිෂ්පාදනය සිදු කරන ප්‍රදේශ අතරින් ලූල්නෑව ගම්මානය තුළ එය පාරම්පරිකව අද දක්වාම මැටි මෙවලම් කර්මාන්තයේ නියැලෙන ජනතාවක් වෙසෙන ගමකි. මෙහි වෙසෙන බොහෝ පිරිසකගේ ජිවනෝපාය කුඹල් කර්මාන්තය හා බැඳේ. මැටි භාණ්ඩ නිෂ්පාදනය සඳහා සුදුසු මැටි තෝරා ගැනිමේ දි මැටිවල ස්වභාවය පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කරයි. කුඹල් කර්මාන්තයට යොදා ගන්නා මැටි වර්ගය වළං මැට්ට ලෙස ව්‍යවහාර කරනු ලැබේ. මෙම මැටිවල ඇති විශේෂත්වය වන්නේ ඇලෙන, නැමෙන හා ඇඹරෙන සුළු බවයි. වැව් ආශ්‍රිතව ඇති කිරල මැට්ට මේ සඳහා යොදා ගනු ලැබේ. ලූල්නෑව ප්‍රදේශයේ වැසියන් මැටි භාණ්ඩ සඳහා සුදුසු මැටි වශයෙන් තෝරා ගනු ලබන්නේ ගම ආශ්‍රිතව ඇති වැවේ කිරල

මැටි ය. මැටි තෝරා ගැනිම ඔවුන්ගේ අත්දැකිම මත සිදු කරයි.

සාම්ප්‍රදායික කුඹල් කර්මාන්තයේ දි මැටි පිළියෙල කර ගැනිම පියවර කිහිපයක් ඔස්සේ සිදු කරයි.

- මැටි පෑයිම (සුදුසු මැටි තෝරා ගැනිම)
- අප ද්‍රව්‍ය ඉවත් කිරිම
- මැටි කැපිම
- මිශ්‍ර කිරිම
- ඇඹරීම සහ පදම් කිරිම
- මැඩවීම (වායු බුබුළු ඉවත් කිරිම)
- ගබඩා කිරිම

වැවෙන් ගෙන එන මැටි වර්තමානයේ දී ද සාම්ප්‍රදායික ක්‍රමයට පෑයිම හෙවත් අපද්‍රව්‍ය ඉවත් කිරිම සිදු කරයි. අදවන විට මැටි ඇඹරිම යන්ත්‍රානුසාරයෙන් සිදු කළ ද ඊට පෙර ඔවුන් සිය නිවෙස්වල දී ජලය දමා හොඳින් පාගා පදම් කිරිම සිදු කර අනතුරුව මැටි කැපිම සිදු කර ඇත. මෙසේ හොඳින් පදම් කරගත් මැටි උපයෝගිකර ගනිමින් භාණ්ඩ නිෂ්පාදනය සිදු කරන ලදි. ඒ සඳහා උපකරණ රැසක් යොදා ගෙනු ලබයි.

- සකපෝරුව
- පත්ත
- ගල

වර්තමානය වන විට මෙම ප්‍රදේශයේ සාම්ප්‍රදායික අත් සකපෝරුව හා විදුලි සකපෝරුව යන උපකරණ දෙකම භාවිතයට ගනු ලැබේ. අත් සකපෝරුවට වඩා විදුලි සකපෝරුවේ කාර්යක්ෂමතාවයෙන් ඉහළ අගයක් ගනි. සකපෝරුව භාවිත කරමින් මැටි භාණ්ඩයේ මූලික හැඩය සකස්කර මැටි භාණ්ඩ මඳ පවනේ වියළීම සිදු කරනු ලැබේ. අනතුරුව පත්ත සහ ගල උපයෝගී කොට ගනිමින් භාණ්ඩයේ අඩිය සහ අවශ්‍ය හැඩය නිර්මාණය කර ගනී.

මෙහි දි පිළිස්සුම් තාක්ෂණය වශයෙන් බහුල ලෙස යොදා ගනු ලබන්නේ පෝරණු ක්‍රමයයි. එය ආකාර දෙකක් යටතේ සිදු කරයි.

- ස්ථිර පෝරණු ක්‍රමය
- තාවකාලික පෝරණු ක්‍රමය

ස්ථිර පෝරණු ක්‍රමය යටතේ ගඩොල් භාවිත කරමින් චතුරස්‍රාකාරව පෝරණුව ඉදි කර ඇත. පෝරණුව තුළට දර දැමීම සඳහා කවුළු තබා ඇත. තාවකාලික පෝරණු සකස් කිරිමේ දී ගඩොල් භාවිතා නොකරයි. මේ සඳහා නිෂ්පාදන දෝෂ සහිත වළං යොදාගනී. මෙම පෝරණු දෙකම ඉදි කරනු ලබන්නේ වහලක් සහිත මඩුවක් තුළ මෙම පෝරණු දෙක තුළ වළං ඇසිරිම සිදු කරන්නේ විශාල වළඳේ සිට කුඩා වළඳ දක්වා එක මත එක ක්‍රමානුකූලව ඇලව පිහිටන ආකාරයටයි. අනතුරුව එම පෝරණුවේ තාපය හොඳින් ආරක්ෂාකර ගැනීම සඳහා උපක්‍රමයක් ලෙස වළං වැසෙන පරිදි පිදුරු අතුරා ඒ මත වළං කැබලි තබා ඒ මත මැටි තට්ටුවක් ආලේප කරනු ලැබේ.

මේ ආකාරයෙන් සකස් කර ගන්නා පෝරණුවට එක එල්ලේම ගින්දර දැල්වීම සිදු නොකරයි. මුලින්ම පෝරණුව අසළ පිටතින් දර කොට දල්වා එයින් ලැබෙන අඟුරු කවුළු තුළින් පෝරණුව තුළට දමයි. මෙලෙස සිදුකරන්නේ අධික තාපයෙන් වළං පුපුරායාම වළක්වාගැනීම සඳහාය. ඉන් පසු පෝරණුව උණුසුම් වූ පසු කවුළු තුළින් පෝරණුව තුළට දර දමා ගිනි දැල්වීම සිදු කරයි. මේ ආකාරයට පැය 5ක් 6 ක් පමණ දල්වනු ලැබේ. අනතුරුව නිවෙන්නට හැර මැටි තට්ටුව ඉවත් කර පෝරණුව තුළින් වළං ඉවත් කිරිම සිදු කරනු ලබයි.

මැටි භාණ්ඩ වර්ණ ගැන්වීම සඳහා වර්ණ සකස් කර ගන්නේ බොරලු ජලයේහොඳින් සෝදා අවසානයේ එහි ඉතිරිවනද්‍රව්‍ය හා විෂබීජ නාශකයක් ලෙස දෙහි යුෂ දමා සකස් කර ගන්නා ලද ද්‍රාවනයකිනි. මැටි භාණ්ඩ වර්ණ ගැන්වීම අවස්ථා දෙකක දී සිදු කරයි.

- වළං පිළිස්සීමට පෙර
- වළං පිළිස්සීමෙන් පසුව

වළං පිළිස්සීමෙන් පසු විශේෂයෙන් විට කෑම සඳහා යොදාගන්නා හුණු යොදාගනිමින් වර්ණ ගැන්වීම සිදුකරයි. මෙහිදී විවිධ රටා මෝස්තර අනුව වර්ණ ගැන්වීම සිදුකරයි.

මේ ආකාරයෙන් දීර්ඝ මෙන්ම සංකීර්ණ ක්‍රියාවලිකින් පසු විවිධ උපයෝගීතාවයන් සඳහා විවිධ හැඩයෙන් නිෂ්පාදනය කෙරෙන මැටි මෙවලම් වෙළදපොළට නිකුත් කිරීම සිදු කරයි.

වර්තමානය වනවට භාවිතයෙන් තරමක් අවම වුවත් ආර්ථිකමය වශයෙන් වටිනාකමක් හිමිකරගන්නා සාම්ප්‍රදායික කර්මාන්තයක් ලෙස මැටි මෙවළම් නිෂ්පාදනය හඳුනාගත හැකිවේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**

සීලවිමල හිමි, රන්නේ. (2013)***ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයේ වළං කර්මාන්තය.***කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.